# බන්වුයි ටිකිරියි



**ඩබ්ලිව්.ඒ.මින්දුලී තිදස්නා**

# බන්ටුයි ටිකිරියි

## මින්දුලි තිදස්නා

**5 ශ්‍රේණිය E**

**2025/02/08**

**ISBN38384**

*පිදුම.....*

*අයන්න ආයන්න කියලා*

*දුන්නු මහාමායා*

*මව්තුමිටයටත්...*

*මගේ ආදරණීය අප්පච්චිටත්,*

*අම්මාටත්*

*ආදරයෙන්*

*පුදමි.......*

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණයෙන් විස්කම්පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නඟා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසැල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රාය රට තුළ යළි ගොඩනඟන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවන් රටේ පාසැල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයිත.ජීවිතයේ මුලු අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනුනො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධිර,මහාමායා බාලිකා විද්‍යාලය,

මහනුවර

# පටුන


1. බන්ටු හොඳ ළමයෙක් .
2. ගමේ ගිහින් පාඩමක්.
3. අපිට හරිම සතුටු දවසක්.

## 01.බන්ටු හොඳ ළමයෙක්


**ඔන්න එකෝමත් එක කාළෙක පුංචි ළමයි දෙන්නෙක් හිටියා. එක ළමයෙක් තමයි බන්ටු.එයා හරිම නරක ළමයෙක්.අම්මා තාත්තා කියනදේ චුට්ටක්වත් ඇහුවේ නෑ.හරිම අකීකරු ළමයෙක් තමයි බන්ටු කියන්නනේ.**

**ඒ වුණාට එයාගේ නංගි හරිම හොඳ ළමයෙක්.එයාගේ නම තමයි ටිකිරි.එයා හරිම කීකරු ළමයෙක් .අම්මා, තාත්තා,වැඩිහිටි අය කියනදේ ඇහුවා**

**ලස්සනට ඉර පායාලා තවත් දවසක් උදාවුණා.ටිකිරි උදෙන්ම අවදි වුණා.දත් මැදලා,මුහුණ සෝදලා පාසැල් යන්න සූදානම් වුණා.ඒත් බන්ටු තාම හොඳටම ගොරව ගොරවා නිදි.**




ටිකිරි නම් උදෙන්ම පාසලට ගියේ හරිම සතුටින්.නමුත් බන්ටු පාසලට යන කොටත් පාසල පටන් ගන්න සීනුවත් ගහලා.හැමදාම බන්ටු පමා වී පාසලට පැමිණීම ගැන ගුරුතුමී දෙමාපියන් ට කීවා.බන්ටුගේ අම්මයි තාත්තයි බන්ටුගැන ගුරුතුමීට කීවා.එදා ඉදන් බන්ටුගේ යාළුවෝ හැමෝම බන්ටුට විහිලු කළා.කව්රුත් බන්ටු එක්ක සෙල්ලම් කිරිමටවත් ගියේ නෑ.දැන් ඉතින් මේ නරක බන්ටු ට මේ සිදුවිම නිසා එයා ගැනම දුක හිතුණා.ටිකිරිට යාළුවෝ ගොඩක් ඉන්නවා.මමත් ටිකිරි වගේ ම හොද ළමයෙක් වෙන්න ඕනි කියලා හොදින් හිතට ගත්තා.



හවස පාසල අවසන්වෙලා ගෙදර ගිහින් මල් පහන් පූජා කරලා බුදු සාදුට පොරොන්දු වුණා අදින් පස්සේ නම් මම හොඳ ළමයෙක් වෙනවා කියලා.

එදායින් පස්සේ බන්ටුත් ටිකිරි වගේම හොඳ කීකරු ළමයෙක් වුණා.පාසලේ ගුරුතුමීලාත්,අම්මයි තාත්තයිත්,යාළුවොත් බන්ටුගේ මේ වෙනස් වීම දැකලා ගොඩාක් පුදුම වුණා.ඒ විතරක් නෙවෙයි බන්ටුට දැන් යාළුවොත් ගොඩාක් ඉන්නවා.

අපි හැමෝමත් අපේ දෙමාපියන්ට,වැඩිහිටියන්ට කීකරු හොඳ ළමයින් වෙමු.



## 2.ගමේ ගිහින් පාඩමක්.

බන්ටුයි ටිකිරියි ඉගෙන ගන්න යන්නේ නගරේ තියෙන ලොකු ඉස්කෝලෙට.ඉතින් එයාලා ඉන්නෙත් මේ ඉස්කෝලෙට ළඟින්මයි.අම්මයි තාත්තයි දෙන්නත් වැඩට යන නිසා මේ දෙන්නා උදේ පාසල් යනවා,දවල් පාසැල් ඇරිලා ක්‍රීඩා පුහුණුවීම්වලට සවස පංතිවලට සහභාගි වෙලා ආයෙත් එන්නෙත් අම්මලා එක්කමයි.

ළමයි දෙන්නා හරිම මහන්සියෙන් දවස ගෙවන්නේ.අම්මටයි තාත්තටයි මේ ගැන හරිම දුකයි.ඔහොම කාලය ගෙවෙනකොට ඉස්කෝලේ නිවාඩු කාලය ත් ටික ටික ළංවුණා.එදා සවස ගෙදර ආවා තාත්තා කීවා,

"පුතේ ,බන්ටු ...ටිකිරි ...හෙට උදේම අපි ගමනක් යනවා...ඔයාලා දෙන්නත් සූදානම් වෙන්න."

"අනේ තාත්තේ අපි කොහේද? යන්නේ.."ටිකිරි ඇහුවා.

"අපි හෙට අත්තම්මලාගේ ගෙදර යනවා"අම්මා කිව්වා.

"අපෝ මට නම් බෑ ගමේ යන්න ."බන්ටු ගත් කටටමකීවා.

"අනේ හරිම හොඳයි.මම නම් හරිම ආසයි".ටිකිරි උඩ පැන පැන කීවා.

කොහොම හරි දෙන්නම එදා රෑ නින්දට ගියේ හෙට ගමේ යන්න ඇඳුම් ටිකත් සූදානම් කරලා.

උදේම හැමෝම ගමන යන්න පිටත් වුණා.ටිකෙන් ටික නගරයෙන් ඈත් වෙලා අම්මාලාගේ ගමට දවල් ඉර මුදුනක් වෙන්න කලින් ආවා.බන්ටුලා එන බව ආරංචි වුණු වෙලාවේ ඉඳන් අත්තම්මයි,සීයයි හිටියේ මඟ බලාගෙන.රසට බත් උයලා කෑම ජාති ගොඩක් හදාගෙන අත්තම්මා බලා හිටියා.සීයා වත්ත පුරා ඇවිදලා හොයාගෙන ආව පළතුරුවලින් මේසේ පිරිලා.ගෙදරම සුවඳයි.

උදේ කෑම කාලා නිදා ගත්ත බන්ටු අවදි වුණේ අත්තම්මගේ මිදුලේ තාත්තා වාහනය නතර කළාට පසුවයි.වට පිට බලපු බන්ටු හරිම පුදුම වුණා.

“මේච්චර ඉක්මනට අපි ආවාද?මටනම් හොඳටම නින්ද ගියා”

“ඔව් අයියේ ඔයා හොඳට නිදි.මම නම් පරිසරිය බලා බලා ආවා..ටිකක් නින්ද ගියා..”ටිකිරි කීවා.

“මෙ පරිසරය හරිම සිසිලසයි.මට අමුතු සනීපයක් දැනෙනවා” බන්ටු කීවා.

ගේ ළඟ තියෙන ඇළේ බැහැලා බන්ටුයි ටිකිරියි හොඳට නෑවා.නාලා අත්තම්මා උයලා තිබුණ බත් රස කර කර කෑවා.

සීයා ගෙදර හදපු මුදවපු කිරි හට්ටියකුත් කාලා දෙන්නම මිදුලේ සෙල්ලම් කළා.කාලෙකින් ළමයි දෙන්නම හරි සතුටෙන් ඉන්නවා.අම්මයි තාත්තයි කථා වුණා.

රෑ රූපවාහිනිය බලන්නේ නැතිව බන්ටුයි ටිකිරියි සීයාගෙන් කතාන්දර ගොඩක් ඇහුවා.රජ කථා,සුරංගනා කථා.ඉස්සර කාලෙ කථා අහලා දෙන්නම නින්දට ගියා.

අත්තම්මලාගේ ගෙදර හරිම ලස්සනයි.උදේට කුකුල්හාමි හඬලනකොට හරිම සිරියාවයි.මේ දෙන්නා ලස්සන පාට පාට කුරුල්ලන් කුරුළු ලෑල්ලට ඇවිත් බත් කන දිහා බලා සිටියා.ලස්සන සමනළයින් ලස්සන මල් චූටි පැණි කුරුල්ලෝ මල් පැණි බොන අපූරුව බන්ටු හරි ආසාවෙන් බලා උන්නා.පරිසරය කොච්චර නම් ලස්සනයිද මන් නිවාඩු දවසටත් කොම්පියුටර් ගේම් ගහනවා.මේ කුරුල්ලන් ගස්වැල් දැක්කේ නැහැනේ.බන්ටු තමන් ගැනම දුක් වුණා.වත්තපහළ සෙල්ලම් කළා.කළු මාමාත් එක්ක රත්තිට තණ කොළ කපන්න ගියා.නංගිත් එක්ක හොඳට සෙල්ලම් කළා.



පාසල් නිවාඩු කාලය ඉවරවෙන්න ළඟ නිසා බන්ටුයි,ටිකිරි ආපසු නගරයට ආවේ හරිම දුකින්.

බන්ටු ගෙදර ආවා ගමන් ම පොඩි කුරුළු ලැල්ලක් තාත්තාට කියලා හදා ගත්තා.එයට බත් ටිකක් දැම්මා.

“නංගි,නංගි,මෙන්න බලන්න කුරුල්ලෝ කෑම කන්න ඇවිත්.” බන්ටු කෑගැසුවා.

අම්මාගේ පොඩි මල් පාත්තිවලට වතුර දැම්මා.ලස්සන මල් වත්තක් අපේ ගෙදරත් මේ තියෙන්නේ.මං මේවා මීට කළින් දැක්කේ නැහැනේ.බන්ටු තමාටම කියා ගත්තා.උදේම අවදිවෙලා පරිසරයේ සුන්දරත්ය වින්දා.පුංචි මල් ගසක කුරුළු කූඩුවක් හදලා.ඒකේ චූටි කුරුළු බිත්තර දෙකක් තියෙනවා ඉන්ටු අම්මාටත් පෙන්නුවා.

ගම නගරය කියලා නෑ ගස්වැල් තියෙන හැම තැනක්ම හරිම ලස්සනයි.අපි පරිසරය දෙස විමසිල්ලෙන් බලන්න ඕනි.බන්ටු ගමේ ගිහින් ඉගෙන ගත්ත පාඩම පුංචි අපි හැමෝටම වටිනවා.

## 3 අපිට හරිම සතුටු දවසක්.

ඔන්න බන්ටු වෙනදා වගේම උදේම ටිකිරි සමඟ පාසල් යන්න පිටත් වුණා.පාසල් බස් රථයෙන් පාසල අසලට ගොස් ගේට්ටුවෙන් ඇතුළට යන්න හදන කොටම ටිකිරි බන්ටුට පෙන්නුවා පොඩි මල්ලිකෙනෙක් පාර අයිනේ අම්මාත් සමඟ බිම වාඩි වී සිටිනවා.ඒ අම්මාගේ කකුළේ තුවාලයක් වගෙත් තියෙනවා නේද බන්ටු නංගිට කීවා.දෙදෙනාම පාර මාරුවෙලා පොඩි මල්ලි ළඟට ගියා.ගිහින් කථා කළා.

"අනේ නැන්දේ මේ මොනවා වෙලා ද?'

"අපිට ගමට යන්න බස් එක අල්ල ගන්න බැරිවුණා.මේ ගස යට තමයි රෑ එළාවෙනකම් හිටියේ." අසරණ නැන්දා කීවා.

මේ දෙදෙනාටම ගොඩක් දුක හිතුණා.අයියේ අපි දැන් මොකද කරන්නේ ටිකිරි දුකෙන් ඇහුවා.

"මේ බත් එක දෙන්නම කන්න" බන්ටු එයාගේ කෑම පෙට්ටිය දුන්නා.

"අද හවස පංතිය තියෙන නිසා අම්මා මට සල්ලි ටිකකුත් දුන්නා.නැන්දා මේ සල්ලිවලින් බස් එකට යන්න." බන්ටු සල්ලියි කෑමයි දුන්නා.ටිකිරි එයාගේ බත් එකත් දුන්නා.අපි උදේට හොඳට බත් කාලා එන නිසා අපිට බඩගිනි නෑ."නැන්දා මල්ලීටත් දීලා කන්න".



එසේ කියලා දෙදෙනා ම පාසලට ගියා.

දිවා ආහාර ගැනීමේ සීනුව නාද වුණා.බන්ටු ඉක්මනින් නැගිටලා ගේට්ටුව අසලට ආවා.අර අසරණ අම්මයි මල්ලියි ඉන්නවාද බැලුවා.ඒ දෙදෙනා එතැන සිටියේ නෑ.

"පුතේ ඔයා මොකද?ඔතන කරන්නේ" පාසල් මුරකරු මාමා බන්ටුගෙන් ඇහුවා.

"අර අර අතන හිටපු නැන්දයි මල්ලියි කොහෙද?කියලා මං මේ බැලුවේ".බන්ටු පිළිතුරු දුන්නා.

"ආ එතකොට ඒ වීර ක්‍රියාව කළේ ඔයා ද?මං එතැනට ගියින් එයාලත් එක්ක කථා කළා.ඒ දෙන්නට කෑමයි සල්ලියි ලැබුණ විදිහ විස්තරේ මට කිවා.මං ඒ ඔක්කෝම විස්තරේ විදුහල්පතිතුමාට කීවා.සර්ටත් හරිම සතුටුයි.මට ඒ වැඩය කළ ළමයි දෙන්නා හොයලා දෙන්න කියලා කීවා"මුර මාමා කියාගෙන කියාගෙන ගියා.

පාසලේ හදිසි රැස්වීමක් තියලා බන්ටුයි ටිකිරියි කළ හොඳ ක්‍රියාව විදුහල්පතිතුමා හැමෝටම කිව්වා.බන්ටුගේ අම්මයි තාත්තායි දෙන්නමත් මේ සඳහා සහභාගී වුණා.හැමෝම බන්ටුටයි ටිකිරිටයි සුභ පැතුවා.

අපිත් පුළුවන් හැම වෙලාවේදීම කාට හරි පොඩි උදව්වක් දෙන්නඕනි අනිත් ළමයිනුත් හිතා ගත්තා.

නිමි



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක පාසැල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පරික්ෂණ ව්‍යාපෘති යටතේ මේවන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහාත්‍ය කෙතේ රෝපණය වීමට ලැබීම අප ලැබූ භාග්‍යයකා.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ එදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසැල් කලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කරඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූණ් වහන්සේලා ද සම්බන්ධ කරගැනිම විශේෂත්වයකි.මෙහි දි මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය,දියණියන්,ගුරුභවතුන්,දෙමාපියන් හා ආදා ශිෂ්‍යාවන් දැක් වූ කැපකිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොතතවම අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය.මනාව දැනුම ගබඩා කර තැබිමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයාන් දුරස්විම අධ්‍යාපනයේ ගුණාත්මකබවට  අනරථකිරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය විමට හේතුවි ඇති බව පරික්ෂණාත්මකව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි.තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනහා දි තිබෙන තම නිසග,සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංශන.

ව්‍යාපෘති නිර්මාණ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්.